

නම් තැබීමේ මංගල්‍යයේ දී අසිත බ්‍රාහ්මණයා සිදුහත් කුමරුගේ දේහ ලක්ෂණ පරීක්ෂා කරන අයුරු

## ඎ බුදු දහම නිවනට මඟක් පමණ ද?

– මහාචාර්ය දේවාලේගම මේධානන්ද හිමි

බුදුදහම හුදෙක් පුද්ගල විමුක්ති ලාභයම පමණක් අරමුණු කරගත් දහමක් නොවන බව ද ලෞකික දිවි පැවැත්ම සාර්ථක කර ගැනීම සඳහා අවශ්‍ය මඟ පෙන්වීම ඒ තුළ අඩුවක් නැතිව ඉදිරිපත් කොට ඇති බවද පහදා දීමට දරන උත්සාහයකි.

## ඎ යුතුකම් ඉටුකිරීම

– උඩුවේ ධම්මාලෝක හිමි – සාකච්ඡා කළේ සීසර් සුදුසිංහ

“දියුණුවේ දෙරටු” විශේෂාංගය යටතේ ලෞකික ජීවිතයේ දියුණුව ලබාගත යුතු පිළිවෙත පිළිබඳ වැඩිපුර සංවාදශීලී බවක් ගොඩනැගී ඇති යුගයක ඒ සඳහා බුදු දහමේ ඇතුළත් නිවන් පිළිවෙත උපයෝගී වන ආකාරය ද – බුදු වදන් තුළ ඇතුළත් ඊට අදාළ වෙනත් උපදෙස් පිළිබඳ ද මෙම ලිපියෙන් සාකච්ඡා කැරේ.

## ඎ වඩා උසස් මිනිසා ද? දෙවියා ද?

– කළුකොඳයාවේ ප්‍රඥාශේඛර මහ නාහිමි

සසර පිළිබඳ යථා තත්ත්වය අවබෝධ කර ගැනීමේදී ද, පින් දහම් රැස් කිරීමේදී ද, කුසලය හා සුචරිතය වර්ධනය කිරීම විෂයෙහි ද, මිනිස් භාවයෙහි ඇති සුවිශේෂ උපයෝගීතාව දේවත්වයට වඩා – එම අරමුණු ඉටුකර ගැනීම පිළිබඳ මිනිසා සතු සුවිශේෂ ශක්‍යතාව.

## ඎ බෞද්ධ අධ්‍යාපනයේ දැක්වෙන නිවැරැදි ඉගැන්වීම් ක්‍රම

– වීදියගම සෝරත හිමි

අධ්‍යාපනයෙහි මූලික අරමුණු වන ජීවන කුසලතා බිහිකිරීම හා පෞරුෂ වර්ධනයට බෞද්ධ අධ්‍යාපන ක්‍රම තුළ හිමිවන ප්‍රමුඛතාව, නිවැරැදි ගුරු – ශිෂ්‍ය සබඳතාවක් තුළින් පුද්ගල පෞරුෂය ගොඩනැංවීම සඳහා බෞද්ධ අධ්‍යාපන ක්‍රම තුළ දක්නට ලැබෙන සුවිශේෂ උපයෝගිතාව.

## ඎ බුදු දහමෙන් පෝෂණය වූ බෞද්ධ කලා සම්ප්‍රදාය

– මක්කාතිගොඩ අස්සජි හිමි

බුදු දහමේ ආභාෂය නිසා සිරිලක සාහිත්‍ය, චිත්‍ර, මූර්ති ආදී වූ කාල විෂය ක්ෂේත්‍ර තුළ ඇතිවූ සුවිශේෂ උන්නතිය විමසුමට ලක් කැරෙන ලිපියකි. ආගමික සංනිවේදන මාධ්‍යයක් හැටියට කලාව යොදා ගැනීම නිසා සිරිලක බිහි වූ නව කලා නිර්මාණවල සුවිශේෂත්වය පෙන්වා දීමට මෙම ලේඛකයා උත්සාහ දරයි.

## ඎ බුදුරුවට නිගරුව

බුදු පිළිමයට අවමන් වන අයුරෙන් ඇතැම් පුද්ගලයන් සිදුකරන විවිධ ක්‍රියා පිළිබඳ කාලීන සංවාදශීලී විශේෂාංගයකි. ඇතැම් අන්‍යාගමික බලපෑම් මත සිදුවන සසුනට පරිහානිකර ලෙස බලපාන බව සැලකෙන මෙවැනි ක්‍රියා වැළැක්වීමට අවශ්‍ය යෝජනා කිහිපයක් ද මෙම විශේෂාංගයට අයත් ලිපි මඟින් ඉදිරිපත් වී ඇත.

## ඎ සාර්ථක දිවියකට බුදුදහම ආලෝකයක් - Why we became Buddhists

– සාකච්ඡා කළේ නෙම්සිරි මුතුකුමාර

ශ්‍රී ලංකාවේ බටහිර සම්භවයක් ඇති කිතුනු පවුලක උපත ලැබ – පසුව සිය සැමියා ද සමඟ බුදුදහම වැළඳගත් කතක් පවසන අදහස්. බුදුදහමෙහි ඇතුළත් ජීවන සාරධර්ම පිළිබඳ ඇය සහ සැමියා තුළ ඇති ප්‍රසාදජනක අවබෝධය මෙම ලිපිය මඟින් ඉදිරිපත් කැරේ.

## ඎ බෙල්ලන්විල ඇසළ පෙරහර

– අතපත්තුකන්දේ ආනන්ද හිමි

කොළඹ දිස්ත්‍රික්කයේ දෙහිවල – ගල්කිස්ස නගර සභා බල ප්‍රදේශයට අයත් බෙල්ලන්විල ප්‍රදේශයේ පිහිටි ඉපැරැණි ඓතිහාසික විහාරස්ථානයක සාම්ප්‍රදයික ලෙස පවත්වාගෙන එනු ලබන ඇසළ පෙරහර පූජෝත්සවය පිළිබඳ තොරතුරු.

## සම්පත් වනසන කරුණු හයක්

– ගලගම ධම්මරංසි හිමි

‘සිගාලෝවාද සූත්‍රය’ ඇසුරෙන් ලියැවුණු විශේෂ ලිපියකි. ගිහියාගේ ධන සම්පත් විනාශවන පිළිවෙත් හයක් පිළිබඳ ඉදිරිපත් වූ බුද්ධ දේශනාවකට අර්ථකථනයකි

## එතෙර බොදු පුවත්

‘එතෙර බොදු පුවත්’ විශේෂාංගය යටතේ පළවන බෞද්ධ ප්‍රවෘත්ති කිහිපයකි.

## ගෝනහේනේ ශ්‍රී වර්ධනාරාම මූලගන්ධකුටි විහාරය

– රංජිත් අම්පිටියාවත්ත

ගම්පහ දිස්ත්‍රික්කයේ මහර ආසනයේ පිහිටි විශාල ශාසනික හා සාමාජික මෙහෙවරක් ඉටුකරන බව සැලකෙන පැරණි විහාරස්–ථානයක් පිළිබඳ තොරතුරු.

## How to transform ourselves

***-by Ven. Boralesgamuwe Pemaratana Thera***

*London Buddhist Vihara*

## බුද්ධ ධර්මය අද සමාජයට ගැලපේ ද?

– මැදගම වජිරඥාණ නාහිමි

බුදුදහමේ දක්නට ලැබෙන සර්වකාලීන වටිනාකම පිළිබඳ විමර්ශ–නයකි. සැම කල එක ලෙස ක්‍රියාත්මක වන ලෝක නියාම ධර්ම හා ඊට සරිලන ලෙස දේශනා කොට ඇති බෞද්ධ පිළිවෙත් සමූහයෙහි ඇති සදතනික අගය මෙම ලිපියෙන් විමර්ශනයට ලක් කැරේ.

## 21 වැනි සියවසේ දහම් පාසලේ ගමන් මඟ

– වහුමුවේ විජයවංශ හිමි

දහම් පාසල මඟින් ඉටු කැරෙන ශාසනික හා සාමාජික මෙහෙවර පිළිබඳ තක්සේරුවක් සමඟ එහි අනාගත ගමන් මඟ කෙසේ විය යුතු ද? යන්න පිළිබඳ යෝජනාවලියක් ලෙස මෙම ලිපිය හැඳින්විය හැකිය.

## සාර්ථක ජීවිතයකට ධම්මපදයෙන්....

– දිවියාගහ යසස්සි නාහිමි

‘ධම්මපදය’ නම් වූ – දහම් උපදෙස් රැසක් අඩංගු සුප්‍රකට බෞද්ධ ග්‍රන්ථය තුළ – සාර්ථක දිවි පැවැත්මක් සඳහා ප්‍රයෝජනවත්, වැද–ගත් උපදෙස් අඩංගු ගාථා පාඨ පිළිබඳ සිදුකැරෙන විමර්ශනයකි.